# රබර් වගාව සඳහා රෝපණ ද්‍රව්‍ය

අගලවත්ත රබර් පර්යේෂණායතනයේ උද්භිද විද්‍යාඥ
**ආචාර්ය ප්‍රියානි සෙනෙවිරත්න විසිනි**

මෙම ලිපියට අදාලවන රූප සඳහා පිටකවරවල ඇතුල් පැත්ත බලන්න.

ශ්‍රී ලංකාවේ පහත රට නිරිත දිග තෙත් කලාපයේ හෙක්. 1,66,000 පමණ භූමි ප්‍රදේශයක පැතිරී පවතින, අප කවුරුත් හොඳින් දන්නා රබර් ශාකය අපටත්, රටටත් පරිසරයටත් එක ලෙස සෙත සලසන්නකි.

දකුණු ඇමෙරිකාවේ ඇමසන් ගඟ ආශ්‍රිත වැසි වනාන්තර වලට ආවේනික වූ රබර් ශාකය (Hevea brasiliensis) ලංකාවට ගෙන එනු ලැබුවේ 1876 දී ඉංග්‍රීසි ජාතික සර් හෙන්රි වික්හැම් විසිනි. එතැන් පටන් අද දක්වා අවුරුදු 119 ක් පමණ වූ කාලයක් පුරා රබර් වගාව, ලංකාවේ හා අනෙකුත් ආසියාතික රටවල ඉමහත් දියුණුවක් ලබා තිබේ.

ශ්‍රී ලංකාවේ රබර් වගා කිරීම සඳහා සුදුසු දේශගුණය සහිත ප්‍රදේශ සීමා සහිත වන හෙයින් රබර් වගා බිම් ප්‍රමාණය තවදුරටත් වැඩි කළ නොහැකි බව පෙනේ. එමෙන්ම, දැනට රබර් වගා කර ඇති ප්‍රදේශවල පිහිටීම සහ අනෙකුත් කරුණු සලකා බැලීමේදී මෙම ප්‍රදේශ වෙනත් වගා මගින් ආක්‍රමණය වීමේ තර්ජනයද අඩු බව පෙනේ. මෙම ප්‍රදේශ බෑවුම් සහ මතුපිට ගල් සහිත බිම් වීම ඊට ප්‍රධාන හේතුව වේ.

වර්තමානයේ, අපගේ ප්‍රධාන අරමුණ බිම් ඒකකයකින් ලැබෙන රබර් ඇස්වැන්න වැඩි කර ගැනීම වේ. මේ සඳහා අළුතින් ආරම්භ කරනු ලබන වගාවන්ට උසස් තත්වයේ රෝපණ ද්‍රව්‍ය යොදා ගැනීමත්, පවතින වගාවන් උපරිම ආර්ථික ඵලදාවක් ලබා දෙන අන්දමට දියුණු කිරීමත් ඉතා වැදගත් වේ.

රබර් වගාවක් ආරම්භ කිරීමෙන් පසු සාමාන්‍යයෙන් අවුරුදු 30 ක පමණ කාලයක් එය පවත්වා ගෙන යාමට සිදු වේ. එබැවින් සම්පූර්ණ ආර්ථික ඵලදායී කාලය තුලම, උපරිම එමෙන්ම හැකිතාක් දුරට වෙනස් නොවන, ඵලදාවක් රඳවා ගත යුතුය. අස්වැන්න වැඩි කිරීමෙහි ලා ප්‍රමුඛස්ථානය ලැබෙනුයේ රෝපණය කරනු ලබන ක්ලෝනය නොහොත් ප්‍රභේදයටයි. යම්කිසි හේතුවක් නිසා වගාව ආරම්භ කිරීමේදී අඩු ඵලදාවක් ලබා දෙන ක්ලෝනයක් යොදා ගත්තේ නම්, එම ඉඩමේ ඊට වැඩි ඵලදාවක් සහිත හෝ වෙනත් හොඳ ලක්ෂණ සහිත ක්ලෝනයක් වගා කිරීමට අවුරුදු 30 ක් පමණ බලා සිටීමට සිදු විය හැකිය. එබැවින් වගා ආරම්භයේදී ක්ලෝනය සහ රෝපණ ද්‍රව්‍ය වල තත්වය පිළිබඳව මනා අවබෝධයක් ලබා ගැනීම සහ සැලකිල්ලක් දැක්වීම ඉතා වැදගත් කරුණකි. වැඩි ඵලදාවක් ලබා දෙන අප රටේ කාලගුණික සහ පාංශු තත්වයන්ට, වඩා හොඳින් ගැලපෙන උසස් ගුණාංග සහිත නව ක්ලෝන, රබර් පර්යේෂණායතනය මගින් වරින් වර නිර්දේශ කරනු ලැබේ. එමෙන්ම වර්තමානයේ භාවිතා කෙරෙන සමහර ක්ලෝන නොයෙකුත් හේතුන් මත නිර්දේශ ලැයිස්තුවෙන් ඉවත් කිරීමටද සිදු වේ.

රබර් වගාව සඳහා පැළ නිෂ්පාදනය කරනු ලබන්නේ බද්ධ කිරීම මගිනි. නිර්දේශිත ක්ලෝන වලින් ලබා ගන්නා බද්ධ අංකුර, බීජ මගින් ලබා ගන්නා ග්‍රාහක පැළ වලට බද්ධ කරනු ලැබේ. මෙය සිදු කරනු ලබන්නේ ග්‍රාහක තවාන් හෙවත් බීජ පැළ තවාන් වලදීය.

## ග්‍රාහක තවාන්

සෑම වර්ෂයකම රබර් ඇට ලබා ගත හැකි අගෝස්තු සහ සැප්තැම්බර් මාස වලදී ග්‍රාහක තවාන් ආරම්භ කළ යුතුය. ශ්‍රී ලංකාවේ දැනට වගා කෙරෙන ඕනෑම ක්ලෝනයක ඇට මේ සඳහා යොදා ගත හැකිය. වියළි දේශගුණයක් සහිත බිබිල, මොනරාගල ආදී ප්‍රදේශවල නම්, දෙසැම්බර් සහ ජනවාරි මාස වලදී ද රබර් ඇට වැටීම දක්නට ලැබේ. කෙසේ හෝ, හොඳ තත්වයේ අළුත් බීජ යොදා ගෙන නිර්දේශිත ක්‍රම වලට අනුව ග්‍රාහක තවාන් සකස් කිරීම ඉතා වැදගත්ය. ඇට එකතු කිරීමේ පටන් පැළ බද්ධ කිරීමේ අවස්ථාව දක්වා ග්‍රාහක තවාන් සකස් කිරීම, නඩත්තුව සහ පාලනය පිළිබඳ සියළු විස්තර "උපදේශ පත්‍රිකා අංක 1992/02 ග්‍රාහක තවාන්" හි සඳහන් කර ඇත. හොඳ තත්වයේ පැළ නිපදවීම සඳහා මුල සිටම නිර්දේශිත ක්‍රම අනුගමනය කිරීම වැදගත්ය. අළුත් ඇට සපයා ගැනීම, ප්‍රරෝහන පාත්තියක් භාවිතා කර ඉක්මණින් ප්‍රරෝහනය වන පැළ තෝරා ගැනීම, ග්‍රාහක තවානේ බිම් සකස් කිරීම, පැළ අතර පරතරය, වැල්පැල තෙලීම, පොහොර යෙදීම, දිලීර නාශක යෙදීම මේ අතරින් ප්‍රධාන තැනක් ගනී. (අංක 1 රූපය බලන්න)

## බද්ධ අතු තවාන්

ක්ලෝනයක් හඳුනා ගැනීමෙන් හෝ නිපදවීමෙන් පසු එය බද්ධ අතු තවානක් ලෙසට පවත්වා ගනු ලැබේ. සාමාන්‍යයෙන් ක්ලෝනයක් හඳුන්වනු ලබන්නේ එය නිපදවනු ලැබූ ස්ථානය හඳුනා ගැනීම සඳහා යොදනු ලබන අකුරු කීපයක් සහිත අංකයක් මගිනි.

උදා: PB 86, RRIC 100, RRIM 600

| | | |
|---|---|---|
| PB | = | Prang Bersa, |
| RRIC | = | Rubber Recearch Institute of Ceylon, |
| RRIM | = | Rubber Recearch Institute of Malayasia |

:

ග්‍රාහක පැළ තවාන් මෙන් නොව බද්ධ අතු තවානක් ස්ථාපනය කිරීමෙන් පසු අවුරුදු 7-8 ක පමණ කාලයක් එම තවානෙන් බද්ධ අතු ලබා ගත හැකිය. බද්ධ අතු තවාන් ස්ථාපනය කිරීම සහ නිවැරදිව පාලනය කිරීම පිළිබඳ සියළු විස්තර "උපදේශ පත්‍රිකා අංක 1994/03 බද්ධ අතු තවාන්හි විස්තර කර ඇත. බද්ධ අතු තවානක් පවත්වා ගැනීමේදී ක්ලෝනයේ අනන්‍යතාවය පවත්වා ගැනීම ඉතා වැදගත් වේ. මෙහිදී අනුගමනය කළ යුතු නීතිමය උපදේශ රැසක් ඇති අතර, සාමාන්‍යයෙන් බද්ධ අතු තවානක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පැළ රබර් පර්යේෂණායතනයෙන් ලබා ගැනීම නිර්දේශ කෙරේ. (අංක 2 රූපය බලන්න)

## බද්ධ කිරීම

බද්ධ කිරීමට යොදා ගන්නා ග්‍රාහක පැළ සහ බද්ධ පොතුවල වයස අනුව ප්‍රධාන බද්ධ ක්‍රම දෙකක් ඇත. මෙයින් අප කවුරුත් හොඳින් දන්නා පැරණි ක්‍රමය දුඹුරු බද්ධ යයි. මේ සඳහා යොදා ගන්නා ග්‍රාහක පැළ අවුරුද්දක් පමණ වයස් වන අතර බද්ධ අතුද සම වයසැති වේ. මේ අවස්ථාවේදී භාවිතා කරනු ලබන බද්ධ පොතු දුඹුරු පැහැති වන අතර, බද්ධ කිරීමෙන් පසු බද්ධ පොතු ග්‍රාහක කඳේ පොත්තෙන් ආවරණය කර පොලිතීන් පටියකින් වෙලනු ලැබේ. (අංක 3 රූපය බලන්න)

හරිත බද්ධය සඳහා යොදා ගන්නා ග්‍රාහක පැළ මාස 6 ක් පමණ වයස් විය යුතු අතර, බද්ධ අතු සති 10-12 පමණ වයස්විය යුතුය. මෙම අතුවලින් ගන්නා බද්ධ පොතු, කොළ පැහැති වන අතර, බද්ධ පොත්ත ග්‍රාහක කඳට තබා ග්‍රාහක කඳේ පොත්ත කපා ඉවත් කොට බද්ධ පොත්ත තබා පොලිතීන් පටියකින් වෙලනු ලැබේ. (අංක 4 රූපය බලන්න)

ලපටි බද්ධ පැළ යනු ප්‍රරෝහණය වන බීජ කෙලින්ම පොලිතීන් මළු වල සිටුවා, වර්ධනය වන ග්‍රාහක පැළයට මාස 3 1/2 - 4 ක් පමණ ගත වූ විට හරිත බද්ධය සිදු කොට නිපදවා ගන්නා පැළයි. (අංක 5 රූපය බලන්න)

බද්ධ කිරීම පුහුණු බද්ධ කරුවන් විසින් සිදු කළ යුතු අතර, සාමාන්‍යයෙන් අධික සූර්යාලෝකය හෝ අධික වර්ෂාව ඇති විට නොකළ යුතුය. සාමාන්‍යයෙන් පුහුණු බද්ධකරුවෙකුට දිනකට පැළ 150-200 පමණ බද්ධ කළ හැකිය. බද්ධ කිරීමෙන් සති 3-4 කට පමණ පසු බද්ධයේ සාර්ථකත්වය පරීක්ෂා කළ යුතුය. සාමාන්‍යයෙන් දැනට භාවිතා කරන ක්ලෝන මගින් 80% - 100% දක්වා වූ සාර්ථකත්වයක් ලැබේ. සාර්ථකත්වය රඳා පවතින්නේ පැළවල හා බද්ධ පොතු වල තත්වය, ක්ලෝනය, කාලගුණික තත්වය, බද්ධ කරුගේ පලපුරුද්ද ආදී කරුණු මතය.

බද්ධය සාර්ථක වූ පැළවල පොලිතීන් පටිය ඉවත් කොට සතියකට පමණ පසු ග්‍රාහක පැළයේ ඉහළ කොටස කපා ඉවත් කරනු ලැබේ. බද්ධ අංකුරයේ වර්ධනය පටන් ගැනෙන්නේ මෙලෙස ග්‍රාහක පැළයේ කඳ ඉවත් කිරීමෙන් සති 3-4 කට පමණ පසුවයි. දුඹුරු බද්ධ පැළ මෙලෙස ග්‍රාහක පැළයේ කඳ කපා ඉවත් කොට "නග්න මූල බද්ධ පැළ" (තවානෙන් ඉවත් කොට බඳුන් නොකරන පැළ) ලෙසට කෙලින්ම ක්ෂේත්‍රයේ සිටුවිය හැකිය. නග්න මූල පැළ ගැලවීම මෝසම් වැසි ආරම්භයේ සිදු කළ යුතු අතර, මනා කාලගුණ තත්ව යටතේ ක්ෂේත්‍රයේදී බද්ධ අංකුරය ලියලා සාර්ථකව ස්ථාපනය වනු ඇත.

වියදම් අධික වුවත් බද්ධ පැළ "නග්න මූල බද්ධ පැළ" ලෙසට ක්ෂේත්‍රයේ සිටුවීමට වඩා ඒවා පොලිතීන් මලු තුළ සිටුවා, මාස 3-4 කට පසු ක්ෂේත්‍රයේ සිටුවීමෙන් වැඩි සාර්ථකත්වයක් ලබා ගත හැකි වේ.

ලපටි බද්ධ පැළ මූල සිටම පොලිතීන් මළු වල වර්ධනය වන නිසා ග්‍රාහක කඳ කපා ඉවත් කිරීමෙන් පසුවද, මාස 3-4 ක පමණ කාලයක්, එම බෑගයේම වර්ධනය වීමට ඉඩහැරිය යුතුය. ඒවා ක්ෂේත්‍රයේ සිටුවනු ලබන්නේ කොළ මාල 2-3 ක් දක්වා වර්ධනය වූ පසුය (අංක 6 රූපය බලන්න). ලපටි බද්ධ පැළ වලද පොලිතීන් මළු වල රෝපණය කරන ලද නග්න මූල පැළවල දක්නට ලැබෙන උසස් ගුණාංග දක්නට ලැබේ.

දුඹුරු හෝ හරිත බද්ධය කරන ලද්දා වූ නග්න මූල හෝ පොලිතීන් මළු වල අසුරන ලද පැළ අතරින් කුමන වර්ගය භාවිතා කළද, ඒවා හොඳ තත්වයේ පැළ වීම, වගාව උසස් තත්වයක පවත්වා ගැනීමට ඉවහල් වේ. මේ සඳහා නිර්දේශිත ක්‍රම අනුගමනය කිරීම ඉතා වැදගත් වේ.

*(මෙම ලිපියේ සඳහන් කර ඇති විස්තර පත්‍රිකා අගලවත්තේ රබර් පර්යේෂණායතනය වෙත ලියා ගෙන්වා ගත හැකි වේ.)*